
# නාගරික ගොවිතැනයි......................
# කාබනික පොහොර භාවිතයයි..................

**නවීන විද්‍යාව විසින් කරන ලද සොයා ගැනීම් වලින් දියුණු කරන ලද මෙවලම් ආශ්‍රයෙන් වඩාත් සුව පහසු වූ ලෝකයක් තනා ගැනීමේ නිරන්තර ක්‍රියාවලියක වර්තමාන මිනිසා**




ඡායාරූපය : රංජිත් දිසානායක

**නාගරික ගොවිතැනේ දී භාවිතා කරන පොහොර වර්ග**

**නිරතව සිටී. ඇතැම් ක්ෂේත්‍රයන්හි, නව සොයා ගැනීම්වල දෙස් දකින ඇතැම් විද්වතුන් ලෝකයේ සහ ලෝක සත්ත්වයන්ගේ චිර පැවැත්ම සහතික කිරීම සඳහා උචිත මාර්ගයන් ගවේෂණය කරයි.** මෙම ලිපියෙන් සාකච්ඡා කිරීමට උත්සාහ කරන්නේ ලෝකයේ සියළුම ජනතාවට එකසේ වැදගත් ක්ෂේත්‍රයක් වූ "**කෘෂි කාර්මික ක්ෂේත්‍රය**" ලෝකයේ යහ පැවැත්ම සහතික කරමින් පවත්වාගෙන යාමට ගන්නා උත්සාහය සම්බන්ධයෙනි.

## පරිසර සහජීවනය

ආසියාතික චින්තනය වූයේ මිනිසා පරිසරය හා සහජීවනයෙන් යුක්තව ජීවත් විය යුතු බවයි. සිවුපාවා සහ ගහ කොළ යන සියල්ල එකිනෙකාට තර්ජනයක් නොවන ආකාරයෙන් ජීවත් වූ අතර මෙය ඒක රේඛීය ජීවන ක්‍රමයක් විය. මෙම ක්‍රමයේ දී පරිසරය මනාව සුරැකුණි. එමනිසා, මනා ජෛව විවිධත්වයක් ද පැවතියේය. ජනගහනයට අවශ්‍ය ආහාර තම ප්‍රදේශ වලින් නිපදවා ගනිමින් ස්වයං පෝෂිත ආර්ථික ඒකක ලෙස පැවති ගම්මානවල ගැමියන්ගේ ජීවිතය ඉතා සරල සහ අල්පේච්ඡ විය.

## විද්‍යාවේ දියුණුව සහ පරිසරය ජය ගැනීම

විද්‍යාවේ දියුණුවත් සමඟම ඉහතින් විස්තර කරන ලද සරල සහ අල්පේච්ඡ ජීවිකා වෘත්තීන් සියල්ල වෙනසකට භාජනය විය. **විද්‍යාවේ අභිප්‍රාය වූයේ පරිසරයත් සමඟ පැවති ඒක රේඛීය සම්බන්ධය බිඳ දමා එම පරිසරය අභිබවා මිනිසා ජය ගැනීමයි.** මිනිස් සමාජය සඳහා සුවපහසු ලොවක් තනා ගැනීමට විද්‍යාව උපයෝගී කර ගනිමින් නොනවතින උත්සාහයක යෙදෙන වර්තමාන සමාජය, ලෝකයේ පවත්නා සම්පත් සියල්ල ඉතා සීඝ්‍ර වේගයකින් පාරිභෝජනය සඳහා හසුකර ගනිමින් සිටී. ඔවුනගේ සිතිවිලි සියල්ලෙහි ඉලක්කය වී ඇත්තේ සම්පත් විශාල ප්‍රමාණයකින් සමන්විත වූ අධිපාරිභෝජන රටාව කි.

## පරිසර විනාශය

මිනිස් සමාජයන් සඳහා සුවපහසු ලෝකයක් බිහි කිරීමේ උත්සාහය සාර්ථක වුවත් එම ක්‍රියාවලියේ ප්‍රතිඵලයක් ලෙස වර්තමාන මිනිස් සාමාජය සහ පරිසරය පමණක් නොව අනාගත සමස්ථ ජීවින්ගේ පැවැත්මට හානිකර තත්ත්වයක් නිර්මාණය වී තිබේ. ඒ බව ලෝකය පුරා විද්වතුන්, සමාජ විද්‍යාඥයන්, දේශපාලනඥයින් සහ පරිසරවේදීන් විසින් ප්‍රකාශ කෙරේ. නවීන විද්‍යාව උපයෝගී කර ගනිමින් ලෝකයේ සෑම අංශයකම සංවර්ධනයක් සිදු වීම හේතු කොට ගෙන පරිසර සමතුලිතතාවය බිඳ වැටීමක් සිදු වෙමින් පවතී. මෙහි

**ඒක රේඛීය සම්බ - -න්ධය බිඳ දමා පරිසරය අභිබවා මිනිසා ජය ගැනීම**

ප්‍රතිඵලයක් ලෙස පෘථිවි උෂ්ණත්වය ඉහළයාම, ඕසෝන් ස්ථරය පළුදුවීම, ජලධාරාවන් විනාශ වී යාම, ජලය අපවිත්‍ර වීම සමඟ ජලාශ්‍රිත සම්පත් සියල්ල

විනාශ වී යාම, පරිසර පද්ධති බිඳ වැටීම, පෘථිවි උෂ්ණත්වය විනාශ වීමෙන් උත්තරාර්ධ ගෝලයේ අයිස් කඳු දියවී ඒවා සාගරයට ගලා යාම නිසා සාගර ජල මට්ටම ඉහළ යාමත් එහිම ප්‍රතිඵලයක් ලෙස ලෝකයේ ඇතැම් රාජ්‍යයන් ගිලීයාම වැනි බරපතල පරිසර ප්‍රශ්න රැසක් පැන නැගී හමාරය. **ජගත් මිහිකත සමුළුව** වැනි ලෝක පරිසර පද්ධතීන් ආරක්ෂා කර ගැනීම සඳහා කැප වූ ආයතන පවා බිහි වී ඇත්තේ මිනිසාට ජීවත් වීමට සුදුසු පරිසරයක් බිහි කිරීමේ ඇති වැදගත්කම වර්තමාන ලෝකයා ට වැටහී ඇති බැවිනි. **1992 පැවති ජගත් මිහිකත සමුළුවේ දැඩි අවධානය යොමු වූයේ ඉහත සඳහන් පරිසර විනාශය අවම කර ගැනීමේ මාර්ග පිළිබඳව විමසා බැලීම සඳහා ය.**

**කෘෂිකර්මයේ අධික වූ පිරිවැය හේතුවෙන් බොහෝ ශ්‍රී ලාංකික ගොවීන් ප්‍රකාශ කරන්නේ කෘෂිකර්මය නම් තවදුරටත් ලාභදායී තත්ත්වයක් නොමැති බවයි.**

## කෘෂිකාර්මික ක්ෂේත්‍රය හා හරිත විප්ලවය

නවීන විද්‍යාව දියුණු වීමේ ප්‍රතිඵලයක් ලෙස 1960 දශකයේ මතු වූ **හරිත විප්ලවය** තුළින් ද පැවති පරිසර හිතකාමී කෘෂිකර්මය නවීන තාක්ෂණය මුසු වූ කෘෂිකර්මයක් බවට පත් කිරීමේ ක්‍රියාවලියක් දියත් විය. වර්තමානයේ නව තාක්ෂණයන් තුළින් නිපදවන ලද යන්ත්‍රෝප-කරණ භාවිතා කිරීම කෘත්‍රිම පොහොර යෙදීම, කෘමිනාශක යෙදීම, වල්නාශක යෙදීම, වැඩි දියුණු කළ බීජ වර්ග උපයෝගී කර ගැනීම වැනි දෑ වැඩි වැඩියෙන් සිදු කිරීමට ගොවිහු පෙළඹී සිටිති. මෙම තත්ත්වය පරිසර දූෂණය තීව්‍ර කිරීමට හේතු වී ඇති අතර ඉතා සීමිත මෙන්ම වැදගත්ම සම්පතක් වූ සරුසාර පස නිසරු බවට පත් වී බෝග නොවැවෙන තත්ත්වයට පත් වීම ද සිදුව තිබේ.

වර්තමානයේ ගොවීන් නව වැඩි දියුණු කරන ලද බීජ වර්ග වගා කරමින් ඒවාට කෘතිම පොහොර හා වෙනත් කෘෂි රසායනික ද්‍රව්‍ය යෙදවුම් විශාල වශයෙන් යොදමින් වැඩි අස්වැන්නක් සහතික කර ගැනීමේ උත්සායක නිරත වී සිටී. ඒ නිසා ඕනෑම කෘෂිකාර්මික බෝගයක් සඳහා වූ නිෂ්පාදන වියදම ඉහළ මට්ටමකට පත් වී ඇතැයි කියැ වේ. මේ තත්ත්වය ශ්‍රී ලංකාවේ බහුතරයක් වූ පුළු ගොවීන්ට නැගී සිටීමට නොහැකි ලෙස දුෂ්ඨ චක්‍රයකට හසු වීමකි. මෙය තවදුරටත් ඔවුන්ට දැරීමට නොහැකි තත්ත්වයක් බවට ද පත් වෙමින් තිබේ. **කෘෂිකර්මයේ අධික වූ පිරිවැය හේතුවෙන් බොහෝ ශ්‍රී ලාංකික ගොවීන් ප්‍රකාශ කරන්නේ කෘෂිකර්මය නම් තවදුරටත් ලාභදායී තත්ත්වයක් නොමැති බවයි.**

### නවීන කෘෂිකර්මයේ අහිතකර ස්ථාන

නවීන කෘෂිකර්මයේ දී කෘතිම පොහොර වර්ග, කෘෂි රසායනික ද්‍රව්‍යය හා උසස් අස්වැන්නක් සහතික කර ගැනීම සඳහා උසස් බීජ වර්ග ගොවිතැනට යොදයි. මෙය පරිසරය විනාශ වීමට, පාරම්පරික බෝග විවිධත්වය විනාශ කර දැමීමට, ග්‍රාමීය ජනතාවගේ සෞඛ්‍යය තත්ත්වය පිරිහීමට සෘජුවම හේතු වී තිබෙන කරුණු කිහිපයක් පමණි. විද්‍යාඥයින්ගේ සොයා ගැනීම් වලට අනුව, **යොදනු ලබන කෘෂි රසායනික ද්‍රව්‍ය බෝගයන්ට ක්ෂණිකව අල්ලාගනු ලබන අතර එම කෘෂි රසායනික ද්‍රව්‍ය අවසානයේ දී සමස්ථ පරිසරයේ ම ස්වයං විනාශයට හේතු වේ. සමසීතෝෂ්ණ රට වලදී ඒවායේ නරක ප්‍රතිවිපාක දැකීමට දිගුකල් ගත වුවද, නිවර්තන රට වලදී එහි වූ දුර්වල පාංශු තත්ත්වයන් හේතුවෙන් ඒවායේ ප්‍රතිඵල කෙටි වන අතර විශාල හානියක් සිදු කරනු ලබයි. (FARM - පර්යේෂණ යෝජනාව 1993)**

නවීන කෘෂිකර්මයේ යෙදීම සඳහා වූ ආම්පන්න මිලදී ගැනීම නිසා පිරිවැය අධික වී ආදායම අඩු වීමෙන් ග්‍රාමීය **ගොවි ජනතාව** විශාල ප්‍රමාණයක් දුප්පත්කම නැමති උගුලේ සිරවී හමාරය. මෙහි ප්‍රතිඵලයක් ලෙස **1970 දශකයේ පමණ සිට ග්‍රාමීය ගොවි ජනතාව විශාල වශයෙන් ණයකරුවන් බවට පත් ව සිටී. මෙහි අනිවාර්ය ප්‍රතිඵලයක් වී ඇත්තේ ගොවීන් පිය ඉඩම් බදු දීමෙන් හෝ උකස් කිරීමෙන් බංකොලොත් භාවයට පත් වූ ඉඩම් නොමැති අසරණයන් බවට පත් වූ සමාජ කොටසක් වීමයි.** කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ මෙම තත්ත්වය හේතුවෙන් බොහෝ ශ්‍රී ලාංකික **ගොවීන් ප්‍රකාශ කරන්නේ කෘෂිකර්මය තවදුරටත් ලාභදායි නොවන බවයි. හෙක්ටර් කොබ්බෑ-කඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය** විසින් සිදු කරනු ලැබූ අධ්‍යයනයන් අනුව ද පැහැදිලි වන්නේ ග්‍රාමීය ගොවීන්

**ගොවීන් ප්‍රකාශ කරන්නේ කෘෂිකර්මය තවදුරටත් ලාභදායි නොවන බවයි.**

කෘෂිකර්මය අත්හැර දමමින් සිටින බවකි. වර්තමාන තරුණයන් කෘෂිකර්මය ජීවිකා වෘත්තිය කර ගැනීමට මැලිකමක් දක්වනු ලබයි. වර්තමාන කෘෂිකර්මයේ තත්ත්වය මෙසේ හෙයින් මෙම අවාසනාවන්ත තත්ත්වයෙන් කෘෂිකර්මය මුදා ගැනීම සඳහා විකල්ප ක්‍රියා මාර්ග සෙවීමේ කාලය දැන් එළඹ තිබේ.

**"තිරසාර බව" යන වචනය සඳහා තේරුම් රැසකි.**

## තිරසාර කෘෂිකර්මය

**තිරසාර බව (Sustainability) යන වචනය සඳහා අර්ථ දෙනු ලබන විද්වතුන් මෙහි තේරුම ලෙස දක්වන්නේ චිරස්ථායි, බොහෝ කල් පවතින, ධරණීය යනා දී තේරුම් රැසකි. මේ පිළිබඳව වඩා විස්තර දක්වන්නන් ප්‍රකාශ කර ඇත්තේ පරිසර හිතකාමී, (Environmentally Friendly) ආර්ථිකමය වශයෙන් දැරිය හැකි, (Economically Viable) දේශපාලන වශයෙන් සාධාරණ (Politically Sound)සාමාජීය වශයෙන් පිළිගත හැකි (Socially Acceptable) යන මූලිකාංග මෙම වචනය තුළ ගැබ් වී ඇති අතිශය පුළුල් තේරුමක් සහිත වචනයක් බවයි.** තිරසාර කෘෂිකර්මය පිළිබඳව අධ්‍යයන් හි නියැලී සිටින විද්වතුන් වර්තමාන කෘෂිකාර්මික සමාජයන් සඳහා සිය පළපුරුද්ද හා දැනුම ලබාදීමට ඉදිරිපත් ව සිටී. එම පිරිස් ලෝකයේ රටවල් කිහිපයකම රාජ්‍ය නොවන සංවිධාන හා සම්බන්ධතා ගොඩනගා ගනිමින් **ජෛවේන්ද්‍රිය කෘෂිකර්මය** වඩ වඩාත් දියුණු කිරීමට හා ගොවිජනතාව අතර ප්‍රචලිත කිරීමට ස්වේච්ඡාවෙන්ම උත්සාහ කරනු ලබයි. 1999.07.09 දින ශ්‍රී ලංකාවේ නාවලපිටියේ "**පසැස**" ආයතනය විසින් සංවිධානය කරනු ලැබූ පරිසර හිතකාමී ගොවිතැන් සංස්කෘතියක් සඳහා වන **සෞභාග්‍යයට දේශීය ඥානය** සහ **නව කැකුළ** නැමති සම්මන්ත්‍රණය මෙම අදහස් ප්‍රචලිත කිරීම සඳහා පවත්වන ලදී.

## කාබනික කෘෂිකර්මය

මිනිසාගේ මූලික අවශ්‍යතාවයක් වන ආහාර අවශ්‍යතාවය සම්පූර්ණ කර ගැනීම හා සමස්ථ ලෝක ප්‍රජාව මුහුණ දී සිටින පරිසර විනාශය අවම කර ගැනීමත් එකවිට කිරීමට සිදුවී තිබේ. ඉහත විස්තර කළ විනාශයෙන් පරිසරය බේරා ගැනීම සඳහා කෘෂිකාර්මික ක්ෂේත්‍රය තුළ සිදුකළ යුතු කාලීන වෙනස්කම් පිළිබඳව පෙරදිග මෙන්ම අපරදිග විශ්වවිද්‍යාලයන් හි, ඇතැම් උගතුන් විවිධ වූ අධ්‍යයනයන් සිදු කරමින් සිටී. නෙදර්ලන්තයේ **වාගිනින්ගන් විශ්ව විද්‍යාලය (Vaginingan University)** මෙවැනි පරිසර හිතකාමී සහ ජනතාවට දැරිය හැකි කෘෂි කර්මයක් සඳහා ගොවි සහභාගිත්වයෙන් පර්යේෂණ පවත්වනු ලබන අපරදිග විද්‍යායතන වලින් ප්‍රමුඛ ස්ථානයේ පසු වේ. මෙම විශ්ව විද්‍යාලය හා සම්බන්ධ පර්යේෂණයන් බොහෝ යොමු වී ඇත්තේ **තිරසාර කෘෂිකර්මයක් සඳහා අඩු බාහිර යෙදවුම් පිළිබඳ අත්හද බැලීම් (Low External Inputs For Sustainable)** කෙරෙහි ය. මේ සම්බන්ධ පර්යේෂණ ආසියා, අප්‍රිකා සහ යුරෝපා මහාද්වීපයන් හි සිදු කරනු ලබන අතර ඒ පිළිබඳ ලබන අත්දැකීම් ලෝකය පුරා ප්‍රචාරණය කරනු ලබන් **LEISA** ප්‍රවෘත්ති සඟරාව මඟින් බෙදා හරී. මෙම තිරසාර කෘෂිකර්මයක් වෙනුවෙන් වූ බොහෝ අත්හද බැලීම් ඒකාබද්ධ පළිබෝධ පාලන ක්‍රම සහ කාබනික පොහොර භාවිතය සඳහා කේන්ද්‍රණය වී තිබේ.

**2001.04.04 දින Daily News පුවත්පතේ Organic Farming will Contribute to Food Security නැමති ලිපියට අනුව මෑතක දී ශ්‍රී ලංකාවට පැමිණි බ්‍රිතාන්‍ය ජාතික කෘෂිකාර්මික විශේෂඥයකු වූ බ්‍රිතාන්‍යයේ ලීඩ්ස් විශ්ව විද්‍යාලයේ පාංශු සහ පරිසර විද්‍යා ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය රිචඩ් තොරොන්ටන් ස්මිත් (Dr. Richard Thornton Smith) ප්‍රකාශ කර ඇත්තේ රසායනික පොහොර ඉහළ මිළ, කෘමි නාශක සහ බීජ වල ඉහළ මිල මෙන්ම නිෂ්පාදන සඳහා ලැබෙන අඩු මිල නිසා ලෝකය පුරා ද ශ්‍රී ලංකාවේ ද කෘෂිකර්මය යන්න අර්බුදයකට පත් වී තිබෙන බවයි. එසේම ගොවිතැන යන්න අද ඉතාම අවදානම් සහිත රැකියාවක් බවට පත් වී හමාරය.** ඌණ සංවර්ධිත රටවල ආහාර ආරක්ෂණය පිරිහෙමින් පවතී. එසේ වුවද, මෙම ආහාර ආරක්ෂණය දියුණු කිරීමේ හොඳ මාර්ගයන් නවමත් නොමැත්තේ නොවේ. **ඉහළ යෙදවුම් සහ නිෂ්පාදන මිල පිළිබඳ ප්‍රශ්නය සඳහා අඩු යෙදවුම් සහිත කාබනික ගොවිතැන් ක්‍රමය හොඳ විකල්පයකි.** පරිසර හිතකාමී ආකාරයෙන් වල් පැල සහ කෘමීන් මර්ධනය කිරීම මෙන්ම පසේ සාරවත් බව වැඩි කිරීම කාබනික ගොවිතැන විසින් සිදු කරනු ලබන බව ඔහු විස්තර කළේය. මෙහිදී පාවිච්චි කරන

**ගොවිතැන යන්න අද ඉතාම අවදානම් සහිත රැකියාවක් බවට පත් වී හමාරය.**

ලබන ක්‍රමය වන්නේ නව තාක්ෂණ ක්‍රමයන්ට වඩා පාරම්පරික සහ ජෛව විවිධත්ව ක්‍රමයන් වේ. තවදුරටත් ඔහුගේ අදහස් අනුව, විශාල ප්‍රමාණයක් වූ **ශ්‍රී ලාංකික සුළු ගොවීන් සඳහා කාබනික**

> **සුළු ගොවීන් සඳහා කාබනික කෘෂිකර්මය අතිශයින්ම ගැලපෙන කෘෂිකාර්මික ආදර්ශයක් වන්නේය.**

**කෘෂිකර්මය අතිශයින්ම ගැලපෙන කෘෂිකාර්මික ආදර්ශයක් වන්නේය.**

## කාබනික කෘෂිකර්මයේ වාසි

කාබනික කෘෂිකර්මයේ දී වියදම් අධික රසායනික පොහොර සහ කෘමිනාශක හා වල්නාශක යොදා නොගනී. මෙහි දී නව වැඩි දියුණු කළ බීජ වර්ග වෙනුවට පාරම්පරික බීජ වර්ග සහ පාරම්පරික දැනුම අනුව වගා කටයුතු සිදු කරයි. **ජෛවේන්ද්‍රිය කෘෂිකර්මය පාංශු පරිසරය යළි ගොඩනගන අතර එහි වගා කෙරෙන බෝග වර්ග නියතයට ඔරොත්තු දේ.** එය ජල දූෂණය අඩු කරන අතර ගොවියාගේ සහ ගොවි පවුලේ සෞඛ්‍යය සම්පන්න බව ආරක්ෂා කරයි. එය පවුලේ මෙන්ම ග්‍රාමීය දුප්පතුන්ගේත් අවසානයේ මුළු මහත් සමාජයේත් ආහාර ආරක්ෂණය වැඩි දියුණු කරයි. තව ද, **කාබනික කෘෂිකාර්මික බෝග වර්ග විශාල දුරක් ප්‍රවාහනය කිරීමට හා දිගුකල් වෙළඳ පොළේ තබා ගැනීමේ හැකියාව ඇති අතර මෙනිසාම ඒවා සඳහා ඉහළ එකතුකළ වටිනාකමක් Added Value ආරෝපනය වීමෙන් ගොවීන්ට වාසි සහගත තත්ත්වයක් උදාවෙයි.** ජාතික වශයෙන් ජෛවේන්ද්‍රිය කෘෂිකර්මයේ ඇති වැදගත්කම වන්නේ මේ මගින් ජනතා සෞඛ්‍යය රැක දෙන නිසා සෞඛ්‍යය ආරක්ෂාව සඳහා වන විශාල වැය අඩු කිරීමට හැකි වීමයි. පොදුවේ පරිසරය ආරක්ෂා වීමෙන් ජාතික වශයෙන් මානව සම්පත් සහ ස්වාභාවික සම්පත් ආරක්ෂා වීමට ද හේතු වෙයි. **කාබනික කෘෂිකර්මය මගින් නිපදවන ලද බෝග කෙරෙහි දේශීය මෙන්ම විදේශීය වශයෙන් ද දනටමත් විශාල ඉල්ලුමක් ඇති අතර එය කාබනික ගොවීන් දිරි ගන්වන සුළු ය.**

මේ ලිපියෙන් සාකච්ඡා කෙරෙන්නේ නාගරික කෘෂි-කර්මයේ දී කාබනික පොහොර භාවිතය සම්බන්ධයෙනි. නාගරික කෘෂිකර්මයේ දී ඊට ආවේණික ලක්ෂණ නිසාම කාබනික පොහොර නිපදවීමට අවශ්‍ය සම්පත් විශාල ප්‍රමාණයක් පවතී. නගරයේ ඉතා කුඩා ඉඩ-කඩක් තුළ හා භාජන තුල කෘෂිකර්මයේ යෙදීමට බොහෝ දෙනාට සිදු වී ඇති නිසා එවන් පරිසරයක් තුල නාගරික කෘෂිකර්මය සුදුසු වේ.

> **කාබනික කෘෂිකාර්මික බෝග වර්ග විශාල දුරක් ප්‍රවාහනය කිරීමට හා දිගුකල් වෙළඳ පොළේ තබා ගැනීමේ හැකියාව ඇති අතර මෙනිසාම ඒවා සඳහා ඉහළ එකතු කළ වටිනාකමක් Added Value ආරෝපනය වීමෙන් ගොවීන්ට වාසි සහගත තත්ත්වයක් උදාවෙයි.**

## නාගරික කෘෂිකර්මය හැඳින්වීම

පළාත් පාලන අමාත්‍යාංශය විසින් මහ නගර සභා, නගර සභා සහ ප්‍රාදේශීය සභා වශයෙන් ශ්‍රී ලංකාවේ පළාත් පාලන ආයතන බෙද වෙන්කොට තිබේ. මෙසේ බෙද වෙන්කොට ඇත්තේ ඒ නගරවල ජීවත් වන ජන සංඛ්‍යාව හා සපයා ඇති පොදු පහසුකම් ප්‍රමාණය වැනි සාධක අනුව ය. **වර්තමාන ජන හා සංඛ්‍යාලේඛන තොරතුරු වලට අනුව ශ්‍රී ලංකාවේ මුළු ජනගහනයෙන් 21.5% ක් නාගරික අංශයේ ජීවත් වන බව සඳහන් ය.** ඉතාම සුළු ඉඩම් ප්‍රමාණයක් සතුව පැවතීම, වැටුප් ලබන විවිධ රැකියාවන් හි සහ වෙනත් වාණිජමය කාර්යයන් හි නිරත වී සිටීම නිසා ඉතාමත් කාර්ය බහුල සමාජයක් පැවතීම මෙන්ම බහුතරය පාරිභෝගික සමාජයක් වීම නාගරික අංශයේ දක්නට ලැබෙන ලක්ෂණයන් ය. තව ද, කෘෂිකාර්මික කටයුතු රැසක් නාගරික අංශයේ පැවති අතර වර්තමානයේ මෙය වර්ධනය වන ප්‍රවණතාවයක් දැකිය හැකිය.

**2001/02/11 දින හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ දී නාගරික කෘෂිකර්මය පිළිබඳ දේශනයක් කළ ඕස්ට්‍රේලියාවේ ඩීකින් විශ්ව විද්‍යාලයේ ආචාර්ය ජෝ රෙමිනි (Dr. Joy Remini)** ට අනුව **ලෝකය පුරා නාගරික ජනතාව කෘෂිකර්මයේ නියැලී සිටීම ලෝකය පුරා දක්නට ලැබෙන ප්‍රවණතාවයකි.** යුරෝපයේ **ලන්ඩන්, නිව්යෝක්,** වැනි

නගරවල ද, ආසියාවේ **බැංකොක්, ඩකා, කොළඹ** වැනි නගරවල වැසියන් ද, යම්කිසි ආකාරයකින් කෘෂිකාර්මික කටයුතුවල නියැලී සිටීම දක්නට ලැබෙන්නකි.

## නාගරික කෘෂිකර්මයේ වාසි

විශාල ගොඩනැඟිලි, මහාමාර්ග හා විවිධ කාර්මික මධ්‍යස්ථාන වලින් සමන්විත කාර්මික පරිසරය තුලට කෘෂි කර්මය නිසා බිහිවන කුඩා ගොවිපළ, වෘක්ෂලතා, පොකුණු, කුඩා හරිතාගාර සහ උද්‍යාන බෝග වගා බිම් වැනි කෘෂි-කර්මයේ අංග එක්වීමෙන් නගරයේ යම් ආකාරයක ප්‍රියමනාප දසුනක් නිර්මාණය වීමක් සිදු වේ. නගරයේ දෛනිකව විශාල වශයෙන් එකතුවන අපද්‍රව්‍ය එක් කිරීමෙන් එක් එක් නාගරික කොටස්වල කෘෂිකර්මයේ යෙදෙන ජනතාව විසින් කාබනික පොහොර නිෂ්පාදනය කෙරේ. එනිසා නගරයේ පවිත්‍රතාවය සහ පරිසරය පිරිසිදු වන අතර වැසියන්ගේ සනීපාරක්ෂාව උසස් තත්ත්වයකට පත්වීම ද සිදුවන බව සඳහන් කළ හැකි ය. නාගරික ප්‍රදේශවල විවිධ කෘෂිකාර්මික කටයුතු ඇතිවීම හේතුවෙන් උද්‍යාන, ගස් වර්ග එකතුවීමෙන් පරිසරය දූෂණය ඉහළ යාම යම් දුරකට පාලනය වී පරිසර සංරක්ෂණයක් ද ඇති වේ. නාගරික දිළිඳු සහ මධ්‍යම පාන්තික පවුල්වල සාමාජිකයන් සඳහා රැකියා අවස්ථා උදාවන අතර එම පවුල් වලට අමතර ආදායමක් ලැබේ. ඉතාම අළුත් එළවළු, පළතුරු සහ පලා වර්ග හා සත්ත්ව නිෂ්පාදන නගරය තුලම නිපදවන නිසා උසස් ගුණාත්මක බවින් යුතු ආහාර ද්‍රව්‍යය පාරිභෝජනය කිරීමට නාගරිකයන්ට අවස්ථාව සැලසේ. නගරයට අවශ්‍ය ආහාර ද්‍රව්‍ය සියල්ල දුර බැහැර ප්‍රදේශවල සිට ප්‍රවාහණය කිරීම සාමාන්‍ය ක්‍රමය වුවත් නාගරික කෘෂිකර්මය නිසා නගරයට අවශ්‍ය ආහාර වලින් යම්කිසි කොටසක් නගරය තුලම නිපද වේ. එනිසා තරමක් හෝ අඩු මිලට අවශ්‍ය ආහාර ද්‍රව්‍ය ලබා ගැනීමට නාගරිකයනට අවස්ථාව සැලසේ. තවදුරටත් නගරයේ භූමිය සහ අපද්‍රව්‍ය වශයෙන් ඉවතලන දෑ උපයෝගී කර ගනිමින් කාබනික පොහොර නිපදවීම සහ ඉවතලන ටයර් මෙන්ම ප්ලාස්ටික් බඳුන්, වගා කරන මෙවලම් ලෙස යොද ගැනීමට හැකි නිසා නගරයේ සම්පත් උපරිම මෙන්ම ඉතා ඵලදයි අන්දමින් උපයෝජනය කිරීමට අවස්ථාව උද වේ.

> **ග්‍රාමීය ජනයා නාගරික ප්‍රදේශ වලට සංක්‍රමණය වීමත් සමඟ ග්‍රාමීය දරිද්‍රතාවය ද නගරයට සංක්‍රමණය වේ.**

නාගරික කෘෂිකර්මයේ වැදගත්කම කැපී පෙනෙන්නේ ලෝකයේ සෑම රටකටම ආහාර ඉතාම අත්‍යාවශ්‍ය වූ දෙයක් බැවිනි. ග්‍රාමීය ප්‍රදේශවල හෝ නාගරික ප්‍රදේශවල හෝ සියළුම ජනයා ජීවත් වන්නේ ආහාර නිසාවනි. **ආචාර්ය රෙමිනි** ට අනුව නාගරික කෘෂිකර්මය වර්තමානයේ වැදගත් වීමට හේතු කිහිපයක්ම තිබේ. ග්‍රාමීය ප්‍රදේශවල ජනයා නාගරික ප්‍රදේශ වලට සංක්‍රමණය වීම වර්තමාන යේ ඉහළ මට්ටමක ඇති අතර එසේ පැමිණෙන විට ග්‍රාමීය ප්‍රදේශයන් හි දී කෘෂිකර්මයේ නියැලීමෙන් ලද සිය දක්ෂතා ද සමඟ පැමිණේ. එමෙන්ම, **ග්‍රාමීය ජනයා නාගරික ප්‍රදේශ වලට සංක්‍රමණය වීමත් සමඟ ග්‍රාමීය දරිද්‍රතාවය ද නගරයට සංක්‍රමණය වේ.** නගරයේ ජනගහනය ඉතා සීඝ්‍රයෙන් වැඩිවන අතර එම පවුල්වල සාමාජිකයන් විශාල ප්‍රමාණයක් සිටී. එම පිරිස් නාගරික දිළින්දන් ලෙසින් වර්ග කෙරේ. **නාගරික කෘෂිකර්මයේ යෙදීමට සිදු වී ඇත්තේ ඉතා අඩු ඉඩ ප්‍රමාණයක හා ජනතාවගේ ප්‍රධානතම රැකියා මාර්ග වලට අමතරව බැවින් ඒ සඳහා වූ ආවස්ථික පිරිවැය ඉතාම අඩුය.** මෙම පිරිස අවට නගර හා සම්බන්ධතා ඇති පිරිසක් බැවින් කෘෂිකාර්මික කටයුතු හා අලෙවි කටයුතු ද පහසු වී තිබේ.

**ග්‍රාමීය ජනයා නාගරික ප්‍රදේශ වලට සංක්‍රමණය වීමත් සමඟ ග්‍රාමීය දරිද්‍රතාවය ද නගරයට සංක්‍රමණය වේ.**

## ශ්‍රී ලංකාවේ නාගරික කෘෂිකර්මය

ශ්‍රී ලංකාවේ **කොළඹ** නගරය ගත් විට කිහිප ආකාරයකින් සිදු කරනු ලබන නාගරික කෘෂිකර්ම කටයුතු දක්නට ලැබේ. කොළඹ නගර සහා සීමාව තුළ බෙහෙවින් පවතින වගුරු බිම් ආශ්‍රය කොටගෙන දිළිඳු ජන කොටස්

*30 වෙනි පිටුවට..........*

**ආර්.එල්.එන්. ජයතිස්ස**
**ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිළධාරී**
**කෘෂි ප්‍රතිපත්ති සහ ව්‍යාපෘති ඇගයීම් අංශය**
හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය.

22 වෙනි පිටුවෙන්..................

## නාගරික ගොවිතැනයි.....ඉතිරි

විශාල වශයෙන් කීර, එළවළු ගණයට වැටෙන බෝග වර්ග වගා කරනු ලබයි. මීට අමතරව කෙසෙල්, පැපොල්, අන්නාසි යන පළතුරු වර්ග තම කුඩා ගෙවත්ත තුළ වගා කෙරේ. බොහෝ නිවාස ආශ්‍රිතව කුඩා පරිමාණයේ සත්ත්ව පාලන කටයුතු (කුකුල්, එළු, ගව, ඌරු) සිදු කරනු ලබයි. මීට අමතරව මහා පරිමාණ ව්‍යාපාරිකයින් විසින් ද කොළඹ නගරයට ඉතා ආසන්නයේ පවතින **කොළොන්නාව, බත්තරමුල්ල, වැල්ලම්පිටිය, මොරටුව** වැනි ප්‍රදේශවල මහා පරිමාණයෙන් සත්ත්ව පාලන කටයුතු සිදුකෙරේ. පොහොර උර, ඉවත් කරන ලද ටයර්, බැරල්, යනාදි උපකරණ යොදු ගනිමින් ගෙවතු අලංකරණය සඳහා එළවළු වගා කිරීමත් දක්නට පුළුවන. උද්‍යාන බෝග වගාව සඳහා අවශ්‍ය පැළ තවාන් ව්‍යාපාරික මට්ටමෙන් සිදු කිරීම ද කොළඹ නගරය ආසන්නයේ දී දක්නට ලැබෙන්නකි. කොළඹ නගරය තුළ හා අවට නගරවල ප්‍රාදේශීයව විශාල වශයෙන් බැහැර

**පරිසර විනාශය හා ගොවීන්ගේ දිළිඳු බව තීව්‍ර කිරීම උදෙසා නවීන කෘෂිකර්මය සැලකිය යුතු දයකත්වයක් උසුලයි.**

කරනු ලබන අපද්‍රව්‍ය යොද ගනිමින් හා සත්ත්ව පාලන කටයුතු සිදු කරනු ලබන ස්ථාන වලින් ඉවත් කරනු ලබන අපද්‍රව්‍ය යොද ගනිමින් වඩාත් සාර්ථක ලෙස කාබනික පොහොර නිපදවා ගැනීමට පුළුවන. වර්තමානයේ දී රසායනික පොහොර මිල වැඩිවීම, කාබනික පොහොර භාවිතයේ වැදගත්කම සහ ඒවා පහසුවෙන් නිපදවා ගත හැකිවීම යන කරුණු අනුව නගරය තුළ සිදුකරන කෘෂිකාර්මික කටයුතු සඳහා කාබනික පොහොර භාවිතය පුළුල් අයුරින් යොද ගැනීම පිළිබඳ ප්‍රවණතාවයක් ශ්‍රී ලංකාවේ ප්‍රධාන නගරය වන කොළඹ නගරය තුළත්, කොළඹ අවට නගර තුළත්, රටේ වෙනත් ප්‍රධාන නගර තුළත්, ප්‍රචලිත වෙමින් පවතින බව සඳහන් කළ යුතුය.

**පරිසර විනාශය හා ගොවීන්ගේ දිළිඳු බව තීව්‍ර කිරීම උදෙසා නවීන කෘෂිකර්මය සැලකිය යුතු දයකත්වයක් උසුලයි.** මෙම තත්ත්වය පාලනය කොට ලෝකය, ජනතාව සතුන්, ගහකොළ යන සියල්ලටම චිරාත් කාලයක් ජීවත් වීමට සුදුසු ස්ථානයක් බවට පත් කිරීමට කාබනික කෘෂිකර්මය නැමති ක්‍රමෝපායය තුළ පුළුල් ඉඩ කඩක් පවතින අතර විශේෂයෙන්ම නාගරික අංශයේ වර්ධනය වන නාගරික කෘෂි කර්මයේ දී කාබනික ගොවිතැන වඩාත්ම යෝග්‍ය බව පෙන්වා දීමට පුළුවන.